# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2347/09 - 2023 අගෝස්තු මස 29 වැනි අඟහරුවාදා - 2023.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* KES/DS/LND/AC/8/9/8.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය මහජන කාර්යය : කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර II යටතේ කැස්බෑව භූගත ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර*:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැස්බෑව නැගෙනහිර ගමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 521210 හි කලාප අංක 03 පත්‍ර අංක 01 හි සඳහන් ඉඩම් කැබලි 02 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7409 පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම්:

01. **කැබලි අංක 223**
ඉඩමේ නම: කහටගහවත්ත, කනන්නෝරුවාවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 15-20 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; අයිතිය රජය; මුල් හිමිකම් කියන අය: අංක 191/1, හොරණ පාර, කැස්බෑව පදිංචි සියඹලාගොඩ කංකානමලාගේ දොන් දේවප්‍රිය චන්ද්‍රසිරි සේනාසේකර; ප්‍රමාණය: හෙක්: 0.3819.

02. **කැබලි අංක 225**
ඉඩමේ නම: කහටගහවත්ත, කනන්නෝරුවාවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 15-20 පමණ වයසැති මිශ්‍ර වගාවක් සහ වතුර ටැංකියක් ඇත; අයිතිය රජය; මුල් හිමිකම් කියන අය: අංක 191, හොරණ පාර, කැස්බෑව පදිංචි සියඹලාගොඩ කංකානමලාගේ දොන් ලලිත් චන්ද්‍රප්‍රිය සේනාසේකර; ප්‍රමාණය: හෙක්: 0.3590.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023.10.10 වැනි දින පෙ.ව. 10.00 ට කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 ඔක්තෝබර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. පී. පේමදාස,<br>
ප්‍රාදේශීය ලේකම්/<br>
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,<br>
කැස්බෑව.

2023 අගෝස්තු මස 21 වැනි දින,<br>
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0279